# සෙත්සිරි පදනම
# SETHSIRI Foundation

23/9, පල්ලෙවෙල - ශ්‍රී ලංකාව 23/9, Pallewela - Sri Lanka,

Reg. No. L-156516 +94-77-8035006, +94-77-4480255, +94-33-2291702 sethsirifoundation@gmail.com


2021 මාර්තු මස 01 වන දින.

අධ්‍යක්ෂක ජෙනරාල්තුමා,
සමෘධි දෙපාර්තමේන්තුව,
සෙත්සිර පාය, 04 වන මහල,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

## ''සෙත්සිරි'' වාර්ෂික ජාතික පිරිත් පිංකම - 2021

''සෙත්සිරි'' පදනම මගින් පුරා වසර දහයකට අධික කාලයක් තිස්සේ අඛණ්ඩව පවත්වාගෙන එන ලද අනුරාධපුර ඓතිහාසික ස්වර්ණමාලී මහ සෑ රදුන් වහන්සේ කේන්ද්‍ර කර ගනිමින් සමස්ථ අටමස්ථාන සියල්ලක් හා දිවයිනේ අනෙකුත් හැකි සෑම පූජනීය ස්ථානයක්ම මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික ආයතන හැකි ප්‍රමාණයක්ද සම්බන්ධ කර ගනිමින් වාර්ෂිකව සමගාමීව පවත්වනු ලබන සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනා පිංකම මෙම වසරේ දී ද 2021 මාර්තු මස 27 වන සෙනසුරාදා දින රාත්‍රී 9.00 සිට පසුදින පහන් වන තුරු පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මෙහිදී මහ සෑ රදුන් වහන්සේ අභියස පැවැත්වෙන මෙම ප්‍රධාන පිරිත් සජ්ඣායනය, දිවයින පුරා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ ලක් හඬ ගුවන් විදුලි විකාශනය (FM 93.5 / 93.7) මගින් ඇසෙන්නට සලස්වා ඊට සමගාමීව දිවයිනේ ඉහත සඳහන් නොයෙක් ස්ථානයන්හි දී ද සජීවී පිරිත් සජ්ඣායනයන් එකම මොහොතක පවත්වා ගෙන යාම අපගේ අපේක්ෂාව වේ.

ඒ අනුව ඔබ සමෘධි දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ දිවයින පුරා ක්‍රියාත්මක වන සියළුම සමෘධි ශාඛා සමිති ජාලය මගින් ද මෙම පිංකම් වැඩසටහන වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ඒ ඒ සමිති පවත්නා ප්‍රදේශයන්හි දී සමගාමී පිරිත් සජ්ඣායනයන් පැවැත්වෙන පිංකම් මධ්‍යස්ථාන ක්‍රියාත්මක කර වීමට කටයුතු යොදන මෙන් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

මේ සඳහා එකී සමිතිය පවත්නා අදාල බල ප්‍රදේශයේ සුදුසු විහාරස්ථානයක් තෝරා ගෙන එහි දායකකාරකාදීන් මෙන්ම ප්‍රදේශවාසී පිරිසද ඊට යොමු කරවා ගනිමින් එම සමෘධි සමිතියේ මූලිකත්වයෙන් මෙම පිංකම පැවැත්වීමට කටයුතු යෙදීම ඉතා සුදුසු යැයි අප යෝජනා කරන්නෙමු. නැතහොත් ඒ සඳහා වෙනත් ගැලපෙන පහසු ස්ථානයක් වුවද යොදා ගත හැක.

මෙම පිරිත් සජ්ඣායනය වෙනුවෙන් සහසම්බන්ධ වන අනෙකුත් මධ්‍යස්ථානයන්හි පිරිත් මණ්ඩප තැනීම හෝ පිරිත් සජ්ඣායනය පිලිබඳ විශේෂ නිපුණතාවයක්, පුහුණුවක් ලැබූ පිරිසක්ම යෙදවීම අනිවාර්ය හෝ අත්‍යාවශ්‍ය නොවන අතර තෙරුවන් නැමද සුදුසු ශීලයක පිහිටා අවැසි මූලික වතාවත් පැවැත්වීමෙන් අනතුරුව අදාල ගුවන් විදුලි විකාශනය මගින් විසිරුවා හරිනු ලබන ප්‍රධාන පිරිත් සජ්ඣායනය එහි සිටින සැමට ඇසෙන්නට සලස්වා ඊට සමගාමීව සජීවී පිරිත් සජ්ඣායනයක් එහි ආරම්භයේ සිට අවසානය දක්වා අධිෂ්ඨානශීලීව පිළිවෙත් රැකගනිමින් මනා අවබෝධයෙන් යුතුව පවත්වා ගෙන යාම පමණක් ප්‍රමාණවත් වේ.

මේ වන විටත් බොහෝ පිරිසකගේ ඉමහත් ගෞරවාදරයට මෙන්ම පැසසුමටද ලක්ව ඇති මෙම මාහැඟි පිංකමේ සුවිශේෂත්වය වනුයේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසටම එකට එක්ව රුවන්වැලි මහ සෑ රදුන් වහන්සේ අභියස, එම විචෘත සෑ මළුවේ දී හෝ මෙම පිංකම හා සම්බන්ධ වන අනෙකුත් කවර හෝ මධ්‍යස්ථානයකදී හෝ සම්ප්‍රදායානුකූලව පිරිත් සජ්ඣායනයෙහි යෙදීමට අවකාශ සැළසීම වේ.

එමෙන්ම මෙමඟින් දිවයින පුරා විසිරී පැතිරී සිටින ලක්ෂ සංඛ්‍යාත පිරිසක් සිල්වත්ව ගුණවත්ව එකම මොහොතක එකට එක්ව මෙම උතුම් පිංකමෙහි නිරතවීමෙන් ගොඩනැගෙන ශක්තිය, බලය අපමණය. තවද

ශ්‍රද්ධා බුද්ධි සම්පන්නව නිසි අවබෝධයෙන් යුතුව කටයුතු කරන්නේ නම් මෙම පිංකමට සහභාගිවන සැමට කිසිදු අතිරේක වියදමකින් තොරව සිය සිත, කය, වචනය යන තුන් දොරම මෙහෙයවා උපරිම ලෙස පිං, කුසල් රැස් කර ගත හැකි, කිසිදු භේදයකින් තොරව සැමට එක ලෙස සෙත ශාන්තිය සළසා ගත හැකි උදාර ආශීර්වාදාත්මක පිංකමක් බව අවධාරනයෙන් යුතුව මෙහිලා සඳහන් කල යුතුය.

අසිරිමත් අසදෘශ මහ සෑ රදුන් වහන්සේ, විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ මුල් කර ගනිමින් සමස්ථ ලංකාවාසී සැමට එක්සත්ව එක්සිත්ව එකම රාත්‍රියකදී සුදුසු යම් ශීලයක ගුණයක පිහිටා තථාගත ශ්‍රී සද්ධර්මයෙන් බිඳක් හෝ සිය සවි පමණින් අවබෝධයෙන් යුතුව මෙසේ පිරිත් සජ්ඣායනයෙහි යෙදෙන්නට අවකාශ සැළසෙන වඩාත් උචිත වූ එමෙන්ම කාලෝචිත වූ මෙම මාහැගි පුණ්‍ය කර්මය යථාර්තයක් කරනු පිණිස අප ගන්නා අපරිමිත උත්සාහයට ඔබ සැමගේ කාරුණික සහයෝගය නිරන්තරයෙන්ම ලැබෙනු ඇතැයි අප උදක්ම බලාපොරොත්තු වෙමු.

එහෙයින් මෙම උදාර ආශීර්වාදාත්මක පිංකම, ශාසනික මෙහෙවර තව දුරටත් ව්‍යාප්තව, ශක්තිමත්ව පවත්වා ගෙන යාම සඳහා මෙහි සඳහන් පරිදි හෝ අපගෙන් විමසා, සුදුසු ලෙස සක්‍රියව දායක වන මෙන් ඔබ සැමට කාරුණිකව ඇරයුම් කරන අතර, මෙය ඔබ විසින් සිදු කරනු ලබන ඔබටම රැකවරණය සැළසෙන උතුම් පිංකමක් මෙන්ම සැමට සැම කල්හි යහපත සදන්නා වූ අගනා ශාසනික මෙන්ම ජාතික මෙහෙවරක් බවද කාරුණිකව සිහිපත් කරන්නෙමු.

තෙරුවන් සරණයි.

සෙත්සිරි පදනම,
23/9, පරගොඩවල,
ශ්‍රී ලංකා

Amarasinghe
------------------------
වෛද්‍ය පී. පී. ඩී. අමරසිංහ - (ලේකම් - ''සෙත්සිරි'' පදනම)